**එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව**
**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට එරාවූර් පත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) UNOPS ආයතනයෙන් 2017 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අංක AE 8132 දරන මොන්ටේරෝ වාහනයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන් ශුද්ධ වත්කම් මෙම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු. මිලියන 276ක් වටිනා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2017 අප්‍රේල් UNOPS ආයතනයෙන් සභාවට භාරදී තිබුණත් මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු ගිණුම්**
**-------------------**

ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය සහ සේවය හැර ගිය සේවකයින් 10 දෙනෙකුට ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබූ සේවක ණය හිඟ රු. 941,942ක් සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**
**---------------------------------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූනීති**,** රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විශ්ලේෂණය කර පහත දැක්වේ**.**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | |
| (i) | I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම් ආදිය සඳහා සම්බන්ධිත නිලධාරීන් දෙදෙනෙකුගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) | III පරිච්ඡේදයේ 59 වගන්තිය | එක් එක් වර්ෂය ආරම්භයේදීම සභා බල ප්‍රදේශය තුළ වෙළෙඳ බදු සම්බන්ධයෙන් තක්සේරු කිරීම් සිදුකර, එයට අනුකූලව වෙළෙඳ බදු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මුදල් රෙගුලාසි **571** | වර්ෂ දෙකක් ඉක්ම වූ රු.641,548 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.20,284,742 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 11,161,865 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,122,877 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හිඟහිටව පවතින බදු මුදල් රු. 2,756,013ක් අදාල පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේදි අයකර ගත යුතු විනෝද බදු රු.746,624 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා විනෝද බදු තක්සේරු කර අයකර ගෙන නොතිබුණි.

(ඇ) 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 සහ 134 වගන්තිවලට අනුව පිළිවෙලින් සභාව විසින් ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා නීතිගත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පවතින ඉඩම්වල පුද්ගලික සන්නිවේදන ආයතන විසින් ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු 4 ක ගාස්තු අයකර ගත නොහැකිව මෙන්ම ඉදිකළ නිවාස හා ගොඩනැගිලිවලින් වරිපනම් බදු අයකර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

සභාවේ සමාලෝචිත වර්ෂයේ මුදල් පොත අනුව පළමු මාස 06 ආරම්භයේදි හා අවසානයේදී පිළිවෙලින් රු. මිලියන 31 සහ රු.මිලියන 40 දක්වා පරාසයකින් මුදල් ශේෂයක් අතැති ශේෂ වශයෙන් දක්නට ලැබුණත්, මෙය ඵලදායි ආකාරයක ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු නොකිරීම හේතුවෙන් මුල් මාස හයේදී රු. මිලියන 1.7ක ආදායමක් සභාව විසින් අහිමි කර ගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1** කාර්යසාධනය

තිරසාර සංවර්ධන අරමුණු

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ඒරාවූර් පත්තු සභා බල ප්‍රදේශයේ පවතින රජයේ වෛද්‍ය ශාලා 03 ක 2016 සහ 2017 වර්ෂවලදී ඉපදුණු ළදරුවන්ගේ බර පිළිවෙලින් ග්‍රෑම් 306 ක් සහ 294 ක් වශයෙන් පැවැති අතර ඔවුන්ගෙන් අඩු බර සහිතව ඉපදුණු ළදරුවන්ගේ බර පිළිවෙලින් ග්‍රෑම් 40 ක් සහ 45 ක් වශයෙන් දක්නට ලැබුණි. මව් හා ළදරු සුභසාධන සේවාවන් සඳහා 2016 වර්ෂයේදී රු.150,000 ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් සභාව විසින් ඉහත වැඩසටහන සඳහා වැයකර නොතිබුණි. තවද, 2017 වර්ෂයේදී සෞඛ්‍ය හා සෞභාග්‍යය පවත්වාගෙන යාම, මව් හා ළදරු සුභසාධන නඩත්තුව සහ සෞඛ්‍යය නඟා සිටුවීම සඳහා රු.350,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත්, වෙන්කළ ප්‍රතිපාදනවලින් රු.57,306 ක් සභාව විසින් අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර වෙනත් අවශ්‍යතා සඳහා උපයෝජනය කර තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**කරඩියනාරු පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය**

ඒරාවූර් පත්තු ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි කරඩියනාරු යන ස්ථානයේ. JICA ණය ආධාර වැඩසටහන මඟින් ග්‍රාමීය පානීය ජල ව්‍යාපෘතියෙන් පවුල් 400 කට පමණ පානීය ජලය බෙදාහැරීම සඳහා

රු.මිලියන 40 ක පමණ වියදමින් ඉදිකර තවත් Paln Lanka ආයතනයෙන් රු.1,782,820 ක් ලබා වැයකර 2015 වර්ෂයේ මැයි මාසයේ සිට ඒරාවූර් පත්තු ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන ජලය බෙදාහැරීමේ වැඩසටහන මඟින් මේ දක්වා ජනතාවට ජලය බෙදාහැර නොතිබුණි. තවද, ජාතික ජල සම්පාදන මණ්ඩලයේ උපදෙස් ලබා නොගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර පිරිසිදු පානීය ජලය මහජනතාවට බෙදාහැරයි නොහැකිව තිබූ අතර ජනතාවගේ වුවමනා සහ අවශ්‍යතා සපුරා නොතිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව, මූලධන ප්‍රතිපාදන යටතේ සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කර පළාත් පාලන සහා මාර්ග ඉදිකිරීමේදී බොරළු යෙදීම නවතා දිගු කාලයක් භාවිතා කළ හැකි ආකාරයෙන් කාපට් දැමීම, තාර දැමීම සහ කොන්ක්‍රීට් දැමීම ආදිය සිදුකළ යුතු බවට දක්වා ඇති නමුත් එයට පටහැනිව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මාර්ග 11 කට එකතුව රු.7,653,816 ක බොරළු දැමීම සඳහා වැය කර තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

**ඇස්තමේන්තු කළ මූලධන වියදමට වඩා තථ්‍ය මූලධන වියදම් එකතුව සියයට 17 කින් වැඩි වී තිබූ බැවින් අයවැය වනාහි ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.**

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
| --- | --- |
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අයවැය පිළියෙල කිරීම | අයවැය පිළියෙල කිරීමේදි පසුගිය වර්ෂවල වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | මාර්ග ඉදිකිරීමේදි මුදල් කොමිෂන් සභාවේ අංක 2016/01 දරන චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය |
| (ඇ) වත්කම් කළමනාකරණය | සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීම සඳහා කටයුතු කළ යුතුය. |